# 5. දෙවන මරණය

සොර මුළ දිනක් කිරි හාමිත් ගෙන ගෙයක් බිඳින්නට ගියෝ ය. සොරු ගෙයි සන්ධි බලා බිඳිති. කිරි හාමි ඔවුනට බැණ වදී. 'තොප වගේ නපුරු අය තවත් ලෝකේ ඇද්ද? අනේ කො තරම් වියදම් කොට කො තරම් අමාරුවෙන් තනා-පූ ගෙයෙක් ද? බිඳිනවා නම් ගෙදර මිනිසුන් ගෙන් අසා බින්දා ම නරක ද?'

කිරි හාමි නවතා-ගත නො හී සොරෙක් අතෙහි වූ යකඩ උළ ඔසවා, 'කට වසා-ගෙන නො සිටියොත් මෙයින් ඇණ මෙ තැන ම මරමි' යි තරවටු කෙළේ ය. 'තොපට හොඳ නම් බිඳිවු. මේ පව් කොට මට නරකාදි යන්නට බෑ' යි කිරි හාමි ඒ ගෙදර කුස්සියට වැදුණේ ය.

කිරි හාමිට එ දා බොහෝ ම බඩ ගිනි වී ය. එ හෙයින් දුම අත ගා බැලී ය. එහි මුං ඇට ටිකක් තිබී ඔහුට අසු විය. හේ එය ගෙන ඇතිලියෙක ලා ලිප තබා පිම්බේ ය. එයින් අලු යට ව තිබුණු ගිනි අඟුරු මතු වී ය. ලිප වටා තිබුණු සිහින් දර කැබැලි හා කොළපු කැබැල්ලක් ද එක් කොට නැවැතත් පිම්බේ ය. එයින් ගිනි ඇවුළුණේ ය.

කිරි හාමි මුං ඇට ටික බදින්නට වන්නේ ය. ලිප ළඟ ම ඉතා නාකි ගෑනියක් උඩට කට ඇර-ගෙන නිදයි.

කිරි හාමි බැදෙන මුං ඇට ටිකක් පොල් කටු හැන්දෙන් ගෙන, 'අනේ ආතේ, මේ මුං ඇට බැදුණා ඇද්ද යි බලන්නැ' යි කියමින් ඒ ගැතිය ගේ ලොකු කටේ ලී ය. අසරණ මැහැල්ල මර හඬ දෙමින් නැගිට දිවුවා ය. ගෙදර මිනිස්සු පිබිද අවුත් කිරි හාමි අල්ලා ගසෙක බැඳ අතින් පයින් පහර දෙන්නට වන් හ.

'අනේ, මා මරන්නට එපා. එක වරක් මා මැරී ආයෙත් යන්තම් පණ ගත්තේ' යි කිරි හාමි කන්නලවු කරන්නට වී ය. 'තා මෙහි සොර කමට ආවා ද' යි මිනිස්සු ඔහුට තමන් ගේ අතපයේ සවිය ම දක්වති. 'මා හොර කමට ආවේ නෑ. සොරුන් සමඟ තමා ආවේ. උන් ගෙය බිඳින කල මා උනට කීවා "ගේ බිඳින්නට එපා" ය කියා. බිඳිතත් ගෙදර මිනිසුන් ගෙන් අසා බිඳින්නට කීවා. උන් ඇහුවේ නෑ. ඉතින් මා කුස්සියට ගොස් බඩ ගින්නට මුං ඇට ටිකක් බැද, බැදුණා ඇද්ද යි බලන්නට මේ ආතා ගේ කටේ ටිකක් දැමුවා. ආතාට මුං ඇට සියල්ල ම නුදුන්නාට දෝ, මර හඬ ලෑවා' යි කිරි හාමි සියලු තොරතුරු කීයේ ය.

ගෙදර මිනිස්සු ඔහු ගේ කථාව අසා, සිනා සී, ඔහු ගෙදර ම නවතා ගත්තෝ ය. හේ ද ගෙදර ඉතා කීකරු ව වැඩ පළ කෙළේ ය.

දිනක් පණම් අටක් දී වළන් ගෙනෙන්නට කිරි හාමි යවන ලදි. කිරි හාමි කඩයට ගොස් වළන් ඉල්වී ය. කඩකාරයා වළන් ගොඩක් පෙන්වා, 'එකක් තුට්ටු දහය' යි කීයේ ය. කිරි හාමි කිපුණේ ය. 'මා නුපුරුදු නිසා රවටන්නට සිතුවා ද? මේ වළඳ තුට්ටු දහයක්! හැබෑවට ම මෙය තුට්ටු දහයක් දී ගන්නා අයත් ඇද්ද? කැමැති නම් මෙය පණම් අටකට දෙනවා. මා ළඟ ඇත්තෙත් එ පමණ යි.' කිරි හාමි මෙ සේ කී කල, 'එහෙ නම් ඇර-ගෙන යනවා. ඉතින් එ පමණ කියන කල නො දී පුළුවන් ද' යි කියා කඩකාරයා පණම් අට ගෙන වළඳ දුන්නේ ය.

කිරි හාමි වළඳත් ගෙන ගෙදර එන අතර මහ වැස්සෙක් ආයේ ය. එයින් හේ හොඳට ම තෙමුණේ ය. ඇඟ සීතල විය. ගෙ මිදුලට එන විට මැරෙන දවස මතක් වී, වහා හිසත් පයත් අත ගා බැලී ය.

දෙ පළ ම එක සැටි සීතල ය. 'මා මළා, මා මළා' යි හඬ නගමින් කිරි හාමි එ තැන ම පෙරළුණේ ය. වළඳ කුඩු ව ගියේ ය. ගෙදර මිනිස්සු වහා දිව ආ හ.

'නැඟිටින්, කිරි හාමි, නැඟිටින්' යි මිනිස්සු කීවෝ ය. 'අනේ මා මළා. හාමුදුරුවන් දිවැසින් බලා කීවේ, හිසත් පයත් එක සැටි සීතල වුණු දා මා මැරෙන බව. අනේ, ඉතින් මා කුණු වන්නට නැර ගෙන ගොස් වළ ලන්න' යි කියමින් කිරි හාමි කෙඳිරි ගෑවේ ය; ඇස් පියා-ගත්තේ ය; කට තද කැර-ගත්තේ ය; දෑත ද දෙ පය ද එක් කෙළේ ය; මළාක් මෙන් ම හොත්තේ ය.

ගෙදර මිනිස්සු බියට පැමිණියෝ ය. 'මේ මරණයට අප අසු වුණොත් ගැලවෙන්නේ කෙසේ දෑ' යි ඔහු සිතූ හ. 'මේ බව එළි වන්නට කලින් මොහු කැලෑවට ගෙන ගොස් දමමු යි එකෙක් කී ය. සියල්ලෝ එයට කැමැති වූ හ. එ හෙයින් සතර දෙනෙක් කිරි හාමි ඔසවා-ගෙන ගොස් කැලෑවෙහි ලා ආවෝ ය.

